"ජනපතිට අභියෝග කළ 'ත්‍රිරෝද' සභාපති මරා දමයි" යන සිරස්තලයෙන් යුතුව ලංකා පුවත්පතේ පළ වූ ලිපියක් පාඨකයින් විසින් අපගේ අවධානයට යොමු කොට තිබිණි.

මෙහිදී පාඨකයින් විසින් ඇසිය යුතු පැනය වන්නේ, මෙහි සිරස්තලයේ ඉදිරිපත් කොට තිබෙනා කාරණා දෙකින් එකක් අනෙකට සෘජුවම බලපාන්නේ කෙසේද -එනම් 'ත්‍රිරෝද' සභාපති ඝාතනය, ජනපතිට අභියෝග කිරීමට සෘජුවම අදාළ වන්නේ කෙසේද- යන්නයි. සිරස්තලය තුළ එසේ එකකට එකක් අසම්බන්ධිත කරුණු දෙකක් සඳහන් කිරීම නිසා, සිදුවීම නොදන්නා පාඨකයෙකු මෙය කියවා නොමග නොයන්නේද?එසේ නැතිනම් "මිය ගිය තැනැත්තා ජනපතිට අභියෝග කළ බව" ඔහුගේ ඝාතනයට අදාළ බව සිරස්තලයට යොදාගැනීම සඳහා පුවත්පතට යම් කිසි වළංගු පදනමක් ඉදිරිපත් කළ හැකිද?

යම් හෙයකින් එවැනි පදනමක් ඉදිරිපත් කිරීමට පුවත්පතට නොහැකි වේ නම්, මෙය මාධ්‍ය ආචාර ධර්මයන් උල්ලංඝනය වන ආකාරයේ සිරස්තල යෙදීමක් ලෙස ගණන් ගැනීමට සිදු නොවන්නේද? ඒ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthics #lka #SinhalaPress #Lanka